25 SEP 2000

# ගෝලීයකරණය තුළ දක්ෂිණ ආසියාවේ නායකත්වය ශ්‍රී ලංකාවට

සදාචාර සම්පන්න
ප්‍රජාතන්ත්‍රවාදී
සාමකාමී තිරසාර
සංවර්ධන මාවතක් සඳහා....

# අපේ ජයග්‍රහණ



ගතවූ වසර හය තුළ,
අප ලැබූ,
ජයග්‍රහණ බිඳක්....

අනාගතය ගැන,
පුංචි ඉඟියක්....

3+
6634
805.51



අපේ දර්ශනය

21

# ගෝලීයකරණය තුළ දක්ෂිණ ආසියාවේ නායකත්වය ශ්‍රී ලංකාවට

# අපේ දර්ශනය

21 වන සියවසට
නව දර්ශනයක්
එළි දක්වා, දැනට
වසරක්ද ඉක්ම වී ඇත.

අතිගරු ජනාධිපතිතුමියගේ නායකත්වයෙන්,
ප්‍රබුද්ධ දේශපාලඥයින්,
ආර්ථික හා සමාජ විද්‍යාඥයින්,
පළපුරුදු හා බුද්ධිමත් පරිපාලකයින්,
දක්ෂ කළමණාකරුවන්,
එක්ව නිර්මාණය වූ.

## 21 වන සියවසේ අපේ දර්ශනය

අපේ - ප්‍රතිපත්ති ප්‍රකාශණය වේ.
අපේ - අනාගත වැඩපිළිවෙලද වේ.
අපේ - මැතිවරණ ප්‍රකාශණයද වේ.

ගතවූ සය වසර තුළ අප ලද අත්දැකීම් සම්භාරය අපේ අනාගත සැලසුම් හා ක්‍රියාමාර්ග නිවැරැදි කර ගැනීම ඉතාමත් වැදගත්ය.

**අප හරියට කලදේට වඩා**

**අපට වැරදුනු තැන් .........**

**අපේ අදහස් හා ආකල්ප**

**අලුත් කර ඇත. .........**

**ඒ අනුව එදා**

**අප ඔබට කියූ දේට අමතරව**

**අප අද මෙසේද කියමු ........**

- දේශයට ගැලපෙන තාර්කික, සැලසුම් සහගත විවෘත ආර්ථිකයක්,
- ප්‍රතිචාරාත්මක විසඳුම් වෙනුවට ධනාත්මක විසඳුම් ලබාදෙන පරිපාලන ව්‍යුහයක්.
- වැරැදි ජනප්‍රිය මත උඩ පදනම් නොවන, නිවැරැදි විද්‍යාත්මක අදහස් මත තීරණ ගන්නා රජයක්,
- අසංවිධිත සැලසුම්කරණය වෙනුවට උපායශීලි චින්තනයක් හා නව සැලසුම්කරණයක්.

## 1. "ආර්ථික වශයෙන් සංවර්ධිත"

යනුවෙන් අප අදහස් කරන්නේ 2005 වන විට අප රටේ, ඒක පුද්ගල ආදායම රු. 84,000. (ඇමෙරිකානු ඩොලර් 1,200) දක්වා ඉහළ නැංවීමත්, 2010 වන විට මේ ප්‍රමාණය රු. 178,000 (ඇමෙරිකානු ඩොලර් 2,400) දක්වා ඉහළ නැංවීමත් වේ. එසේම ආදායම් ව්‍යාප්තියේ මුළු ආදායමෙන් 50% ක් පවුල් 40% ක් අතර බෙදී යා යුතුය. එසේම කාර්මික නිෂ්පාදන සංයුතිය 2005 වන විට 30% දක්වා වැඩි විය යුතුය.

## 2. "දේශපාලන වශයෙන් ස්ථාවර"

යන්නෙන් අදහස් වන්නේ 2005 වන විට ජනවාර්ගික ගැටළුව සහමුලින්ම විසඳා ගත්, දේශපාලන වශයෙන් ස්ථිරසාර විසඳුම් සහිත, විමධ්‍යගත, කාර්යක්ෂම හා ඵලදායී පරිපාලන ක්‍රමයක් වේ.

## 3. "සමාජ සාධාරණත්වය සහතික කළ"

යන්නෙන් අප විවෘත, නීතිගරුක, සාමකාමී, විනිවිද පෙනෙන තුළ, සංවර්ධිත පරිපාලන ක්‍රියාවලියක් අපේක්ෂා කරන අතර, ඒ තුළ සමානාත්මතාවය සහතික කළ විවිධත්වය තුළ ජාතිකත්වය පිළිබඳ සංකල්පය පදනම් කරගත් ක්‍රියාවලියක් තිබිය යුතුය.

## 4. "ප්‍රශස්ත ප්‍රජාතන්ත්‍රවාදයක්"

යන්නෙන් අදහස් වන්නේ නිවැරදි ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ පවතින වාස්තවික තත්ත්වයන්ට ගැලපෙන සංවර්ධනයට හිතකර ප්‍රජාතන්ත්‍රවාදයක් ස්ථාපිත කිරීමයි.

## 5. "තිරසාර"

යන්නෙන් අදහස් වන්නේ පරිසරයට හිතවත් වූත්, ආර්ථික වශයෙන් ශක්‍ය වූත්, සමාජීය වශයෙන් සැමට සාදරණවූත් ආර්ථික ක්‍රියාදමයකි.

## 6. "ජාත්‍යන්තර වශයෙන් තරඟකාරී හා මිත්‍රශීලී"

යන්නෙන් අදහස් වන්නේ ජාතික හිමිකම් රැකෙන්නාවූත්, ජාතික උවමනාවන් රැක ගැනීමට හිතකරවූත් කිසිදු බලකඳවුරකට නොබැඳී, මධ්‍යස්ථ විදේශ ප්‍රතිපත්තියක් තුළ, සියළු රටවල විශ්වාසය, හා සුහදත්වය පවත්වා ගනිමින්, දේශීය නිෂ්පාදනයන්ගේ ජාත්‍යන්තර තරඟකාරී බව ප්‍රශස්ථ මට්ටමකින් පවත්වාගෙන යමින්, අප රජයේ ආර්ථික සංවර්ධන ක්‍රියාදමය සහ විදේශ ප්‍රතිපත්තියට ජාත්‍යන්තර සහයෝගය තවදුරටත් ලබා ගැනීමයි.

## 7. "සැලසුම් සහගත විවෘත ආර්ථික ක්‍රමයක්"

යන්නෙන් අප අදහස් කරන්නේ ධනවාදයේ ක්‍රියාශීලීත්වය, කළමනාකරණය, තාක්ෂණය හා සමාජවාදයේ සමාජ සාදරණත්වය මුල් වූ සාධනීය ලක්ෂණ ඒකාබද්ධ වූ ක්‍රමයකි. රජය දිගුකාලීන හා කෙටිකාලීන සැලසුම් සකස්කොට, ඒවා ක්‍රියාත්මක කිරීමට මඟ පෙන්වමින්, සුදුසු පරිසරය නිර්මාණය කර දෙයි. පෞද්ගලික අංශය මෙම ක්‍රමයේ ප්‍රධාන යන්ත්‍රය වන අතර, ඔවුන් රජය හා එක්ව තම කටයුතු ක්‍රියාවට නංවයි.

## 8. "ශ්‍රී ලාංකික ජාතික උරුමයන් හා වටිනාකම් රැක ගනිමින්"

යන්නෙන් අදහස් වන්නේ මානව හා ආර්ථික සංවර්ධනයට අහිතකරවූ ද, බාධාකාරී වූද, ඇතැම් අදහස් ප්‍රවේශමෙන් ඉවත් කරමින්, අපේ ශ්‍රී ලාංකික ශ්‍රේෂ්ඨ උරුමයන් හා වටිනාකම් රැක ගනිමින් කෙරෙන සංවර්ධන ක්‍රියාදමයකි.

ගතවූ හය වසර තුළ

අප බොහෝ දේ කර ඇත

තවත් බොහෝ දේ

ඉටු කරමින් සිටී.

සැලසුම් මට්ටමේ තිබෙන,

සමීක්ෂණ මට්ටමේ තිබෙන

කටයුතු බොහෝය.

මේ සියළු දේ ගැන දීර්ඝ විස්තරයක් "ජාතියේ හෙට දවස ගොඩ නැගූ හය වසර" නැමති ප්‍රකාශණයේ ඇත. මේ නිසා අපේ ප්‍රතිපත්ති ප්‍රකාශණයේ එ පිළිබඳ විස්තර ඉදිරිපත් නොකෙරේ.

එහෙත්
ගතවූ හය වසර තුළ
අප ලැබූ
ආර්ථික ජයග්‍රහණ
කීපයක් පමණක්
පහත දක්වමු.

1. 1994 දී රු. 32,414/- ක් වූ ඒක පුද්ගල ආදායම 1999 දී රු. 58,323/- දක්වා වැඩි කිරීම. (ඇ. ඩො. 515 සිට 829 දක්වා වැඩි වීම)

2. 1994 දී 14.4 % ක් වූ විරැකියා ප්‍රශ්ණ 1999 දී 8.0% දක්වා අඩු කිරීම.

3. ජාතික ඉතිරි කිරීම් 18% සිට 23.9% දක්වා වැඩි කිරීම.

4. 1994 රුපියල් කෝටි 51,499 ක් වූ දළ ජාතික නිෂ්පාදනය 1999 වන විට රුපියල් කෝටි 97,692 ක් වේ.

| | 1994 (රුපියල් මිලියන) | 1999 (රුපියල් මිලියන) |
|---|---|---|
| i. කෘෂි නිෂ්පාදන | 98,519 | 163,491 |
| ii. වී නිෂ්පාදන | 21,241 | 30,197 |
| iii. අනෙකුත් කෘෂි භෝග (තේ, රබර්, පොල් හැර) | 58,047 | 101,061 |
| iv: වන සම්පත් නිෂ්පාදන | 11,475 | 17,675 |
| v. ධීවර නිෂ්පාදන | 14,373 | 25,838 |
| vi. පතල් හා ආකර නිෂ්පාදන | 10,473 | 18,322 |
| vii. කෘෂි අංශයේ සුළු නිෂ්පාදන | 80,482 | 163,103 |
| viii. කර්මාන්ත ශාලා නිෂ්පාදන | 64,174 | 125,893 |

| | | | |
|---|---|---|---|
| ix. | ඉදිකිරීම් අංශයේ මුළු අගය | 38,323 | 75,538 |
| x. | විදුලිය, ගෑස් හා සනීපාරක්ෂක සේවා | 7,727 | 14,425 |
| xi. | ගබඩා, පරිවහන හා නිවාස | 35,617 | 80,698 |

5. 1994 දී 14.3% කට තිබු උද්ධමනය දැන් 8% දක්වා පහත දමා ඇත. මේ තුලින් ජීවන මිළ වැඩිවීම ඉතා අඩු මට්ටමක පවත්වාගෙන යාමට හැකිවිය. විශේෂයෙන් යුද්ධයක් පවතින රටක 8% ට ජීවන මිළ වැඩිවීම සීමා කිරීම අපේ ස්ථිර ජයග්‍රහණය කි.

6. 1994 වන විට අපේ ග්‍රාමීය ජනතාවගෙන් විදුලිය, පාවිච්චි කලේ 34% ක් පමණි. 1999 වන විට එය 53 % දක්වා වැඩි කර ඇත.

7. 1994 වන විට විදුලි උත්පාදනයේ 80 % ක් ජල විදුලිය මත රඳා තිබුණි. අද එය 67% දක්වා අඩු කර ඇත.

8. 1994 දී අප රටේ තිබු මුළු දුරකථන ප්‍රමාණය 181,000 වු අතර, 1999 වන විට රජය විසින් ලබා දී ඇති දුරකථන ප්‍රමාණය 580,199 වු අතර, මීට අමතරව පෞද්ගලික සමාගම් විසින් නිකුත් කළ දුරකථන හා සෙලියුලර් දුරකථන 256,665 ක් වී ඇත.

9. අපි බලයට පත්වන විට, මේ රටේ ගෑස් පාවිච්චි කළ පවුල් ඒකක ප්‍රමාණය ලක්ෂ 3 කි. අද මේ ප්‍රමාණය ලක්ෂ 12.5 දක්වා වැඩි වී ඇත.

10. ගතවු වසර හය තුළ රජයේ සේවකයින්ගේ වැටුප් 75 % ක පමණ ප්‍රමාණයකින් වැඩි කිරීම.

# අපේ අනාගත වැඩපිළිවෙල පිළිබඳව පුංචි ඉඟියක්

## යුද්ධය හා ජනවාර්ගික ප්‍රශ්නය

1. ශ්‍රී ලංකාවේ සියළු ජාතික දේශපාලන පක්ෂවල, ආගමික සංවිධානවල හා වෙනත් ජන කණ්ඩායම් වල සහය ලබා ගනිමින්, බිහි කෙරන නව රජයක් මගින් විධායක ජනාධිපති ක්‍රමය අහෝසිකර, බලය විමධ්‍යගත කරන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කර, ක්‍රියාත්මක කිරීම අප රජයේ ප්‍රධාන වගකීම කොට සලකනු ලබයි.

2. සිංහල බෞද්ධ අතිබහුතරයක් ජීවත්වන හා සිංහල බෞද්ධ නායකත්වයක් යටතේ පාලනය වන රටක ශ්‍රේෂ්ඨ පුරවැසියන් ලෙස අපි බලය විමධ්‍යගත කිරීමටත්, සියළු ජාතින් ආගමිකයන් සමානයන් ලෙස සැලකීමටත් දේශපාලන වශයෙන් ද, ව්‍යාවස්ථානු කූලව ද සූදානම් බව උතුරු නැගෙනහිර ජනතාවට හා ලොව අන්‍ය ජාතිකයන්ට සහතික කර දෙමින්, ඒ සියලුදෙනාගේම සහය හා ආධාරය ලබා ගනිමින් ප්‍රභාකරන් ඇතුළු ත්‍රස්තවාදී ව්‍යාපාරය සහමුලින් යුධමය වශයෙන් පරාජය කිරීම අපේ මූලික අරමුණකි.

## ආර්ථිකය

1. 1994 දී රු. 32,414 ක් වූ ඒක පුද්ගල ආදයම 1999 වන විට රු. 58,323 දක්වා වැඩි කළ අප රජය, 2005 වන විට එය රු. 93,000 දක්වාත්,2010 වන විට රු275,000 දක්වා ඉහළ නංවනු ඇත. (1$ = රු. 78.00)

2. පසුගිය වසර 5 තුළ 5% ක පමණ ආර්ථික සංවර්ධන වේගයක් පවත්වා ගත් අපි ඉදිරි වසර 5 තුළ එය 7% හා 8 % දක්වා වර්ධනය කිරීමට අපේක්ෂා කරමු.

3. අප රටේ පහළම ආදයම් මට්ටමේ සිටින 10% වන දිළිඳුම ජනතාවට රටේ මුළු ආදායමෙන් දැනට අයත්ව ඇත්තේ 4.3 % කි. මේ ප්‍රමාණය 2005 වන විට 10% දක්වා වැඩි කිරීම අපේ අරමුණයි.

4. 2005 වන විට සමස්ථ උද්ධමනය 5% දක්වා අඩු කිරීමට අපි බලාපොරොත්තු වෙමු. මේ තුලින් බඩු මිල වැඩිවීම තවදුරටත් සීමා කිරීම.

5. දේශීය ඉතිරි කිරීම් 2005 වන විට 28% දක්වා ඉහළ නැංවීම අපේ ඉලක්කයකි.

6. ආර්ථිකයේ එකතුවන කළු මුදල් ඵලදායී ආයෝජනවලට යොදගැනීම සඳහා විශේෂ සහනදායී බදු ක්‍රම, විටින් විට හඳුන්වා දෙනු ලැබේ.

## විරැකියාව

1. 1994 දී ලක්ෂ 8 කට වඩා (14.4%) තිබූ විරැකියාව 1999 වන විට ලක්ෂ 6 කට (8.6%) අඩු කළ මේ රජය, ඉදිරි වසර 5 තුළ එය ලක්ෂ 3 කට (5%) අඩු කර ඉදිරි වසර පහ තුළ විරැකියාව අවසන් කිරීමට කටයුතු කරනු ඇත. ඒ අනුව ඉදිරි වසර 5 තුල දී රජය හා පෞද්ගලික අංශයේත්, විදේශ ආයෝජන වලත් ප්‍රමාණය විශාල වශයෙන් පුළුල් කරන අතර, විදේශ රැකියා ඉඩකඩ පුළුල් කර ගැනීමටද අප රජය කටයුතු කරනු ඇත.

2. 2005 වන විට රැකියාවක නිරත විය හැකි සෑම අයෙකුටම ඵලදායී රැකියා අවස්ථාවක් ලබාදීම අපේ ඉලක්කයයි.

# කෘෂිකර්මය

1. කෘෂි කර්මාන්තයට නවීන තාක්ෂණය ඇතුළු කර පර්යේෂණ හා ව්‍යාප්ති සේවා පුළුල් කර, වාරිමාර්ග හා වැව් අමුණු පුළුල් කර, හොඳ බීජ නිෂ්පාදනය හා භාවිතය වැඩි කර, මූල්‍ය හා අලෙවි පහසුකම් වැඩිකර, කෘෂි නිෂ්පාදන වියදම අඩුකිරීමටත්, ඵලදායීතාව විශාල ලෙස වැඩිකිරීමටත්, ඒ තුළින් ගොවි ජනතාවගේ ආදායම දෙගුණ කිරීමටත් අප රජය කටයුතු කරනු ඇත.

2. අල, ළූණු, මිරිස්, එළවළු, නිෂ්පාදකයින් හා කිරි ගොවියා ආරක්ෂා කිරීමටත්, ඒවායේ නිෂ්පාදන වියදම අඩු කර, නිෂ්පාදන තත්ත්වය උසස් කිරීමටත්, ලෝක වෙළඳපල සමඟ තරඟ කිරීමටත් හැකිවන ලෙස දේශීය ගොවියන් ශක්තිමත් කිරීම මිලඟ සය වසරේ අප රජයේ ප්‍රධාන ඉලක්කයක් වී ඇත.

3. උසස් තත්ත්වයේ එලවළු, පලතුරු හා සම්ප්‍රදායික සුළු අපනයන භෝග වගාවන් නවීන තාක්ෂණය යටතේ සීඝ්‍රයෙන් දියුණු කිරීමටත් මෙම කෘෂි කටයුතු වලට සම්බන්ධ වී සිටින ගොවින්ට ඒ සඳහා දැනට ලබා දෙන විශේෂ ආධාර, පුහුණු වැඩ සටහන් පුළුල් කර විශේෂ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම.

4. සෑම ගොවියෙකු සඳහාම අඛණ්ඩ අවම මාසික ආදායමක් ලබාදෙන වැඩ පිළිවෙලක් හඳුන්වාදීම.

5. වී, අල, ළූණු, ඇතුළු සියළුම ජාතික කෘෂිභෝග නිෂ්පාදනය හොඳ මිලකට අලෙවි කිරීමට අවශ්‍ය ශක්තිමත් විධිවිධාන රජය විසින් ක්‍රියාත්මක කිරීම.

6. කෘෂි කාර්මික කටයුතු සඳහා ශක්තිමත් කෘෂි සංවර්ධන බැංකුවක් ඇති කිරීම.

# කර්මාන්ත

1. දේශීය, විදේශීය ආයෝජකයන්, ප්‍රාග්ධන හිමියන්, දිරිමත් කරමින් නවීන කර්මාන්ත ශාලා තව තවත් ඇති කිරීමටත්, දැනට තිබෙන කර්මාන්ත ශාලා තාක්ෂණික හා නිෂ්පාදන මට්ටමින් ඉහළ තත්ත්වයකට ගෙන එමටත්, සුළු හා මධ්‍ය පරිමාන කර්මාන්ත ක්ෂේත්‍රයට දැනට ලබාදෙන සහනාධාර හා පහසුකම් වර්ධනය කිරීමටත්, රෙදි පිළි හා ඇඟළුම් කර්මාන්ත ශාලා හිමියන් තව දුරටත් ශක්තිමත් කිරීමටත් අප රජය ක්‍රියා කරනු ඇත.
2. අප රටෙන් විදේශ රටවලට අමුද්‍රව්‍ය ලෙස යන කෘෂි හා ඛණිජ ද්‍රව්‍ය ආශ්‍රයෙන් නිමි ද්‍රව්‍ය නිපදවන කර්මාන්ත ශාලා බිහි කිරීම සඳහා ඉදිරි හය වසර තුළ අප රජය ප්‍රමුඛතාවයක් දෙනු ඇත.
3. ශ්‍රී ලංකාව තුළ High Tec, Top End, High Design, Solid කර්මාන්ත සංවර්ධනය සඳහා පියවර ගනු ඇත.

# මුදල්, බැංකු, වෙළඳ

1. අයවැය හිගය තවත් අඩුකර එමගින් බැංකු පොළී අනුපාතය 7% දක්වා අඩු කිරීම අපේ අරමුණයි.
2. අප රටේ නිෂ්පාදනයන්, බෙදාහරින්නට හා සේවා සපයන්නට වඩාත් පහසු ක්‍රම මගින් මූල්‍ය පහසුකම් සැපයීම තව තවත් පුළුල් කෙරේ.
3. ඇඹිලිපිටිය, හම්බන්තොට, වැලිමඩ, වව්නියාව, ත්‍රිකුණාමලය හා පුත්තලම යන ස්ථානවල දඹුල්ල වැනි විශේෂ ආර්ථික මධ්‍යස්ථාන ඇතිකිරීම, දැනටම මෙම මධ්‍යස්ථාන ආරම්භ කිරීමට මූලික කටයුතු කෙරෙමින් පවතී. මෙ තුලින් කෘෂි භෝග අලෙවිය සඳහා ගොවීන් ශක්තිමත් කිරීම.
4. අපනයන හා ආනයන කර්මාන්ත වල තරගකාරී හැකියාව වැඩිකර ගැනීමට අවශ්‍ය ආයතනික ව්‍යුහය සකස් කිරීම හා ඒ සඳහා ඇති විවිධ රාජ්‍ය ආයතන ඒකාබද්ධ කර කාර්යක්ෂමතාවයද දියුණු කිරීම,
5. දේශීය හා විදේශීය ආයෝජකයන් තව තවත් දිරිමත් කෙරෙන ලිහිල් මූල්‍ය, බැංකු හා බදු ප්‍රතිපත්ති ඉදිරියටත් අනුගමනය කිරීම,

6. ජාත්‍යන්තර වෙළඳපල ඉලක්ක කර ගත් නිෂ්පාදන හා සේවා අංශ දිරිමත් කිරීම හා අපගේ නිෂ්පාදන ජාත්‍යන්තර තත්වයයට ගෙන එම සඳහා කටයුතු කිරීම.
7. ශ්‍රී ලංකාව ජාත්‍යන්තර වාණිජ මාධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට කටයුතු කරනු ඇත.

## ධීවර

2005 වන විට ධීවර කර්මාන්තය වැඩිකිරීම සඳහා අවශ්‍ය නවීන බෝට්ටු හා උපකරණ අවශ්‍යතාවලින් 65% ක් සැපයීම අප රජයේ බලාපොරොත්තුව වේ. ධීවර මිරිදිය මත්ස්‍ය කර්මාන්තය විද්‍යාත්මකව වැඩි දියුණු කිරීමට අවශ්‍ය ආධාර, පුහුණුව හා පහසුකම් දැනට වඩා පුළුල් ලෙස රජය විසින් ලබාදෙනු ඇත.

1. මසුන් ඇල්ලීම, ගබඩා කිරීම ප්‍රවාහනය සඳහා දැනට ලබා දෙන නවීන පහසුකම් තවත් පුළුල් කිරීමට කටයුතු කරනු ඇත.
2. එසේම සෑම ධීවර කලාපයකටම අංග සම්පූර්ණ ධීවර වරායන් හා නැංගුරම් පොළවල් ඇති කිරීමට ඉදිරි පස් වසර තුළ අප රජය විසින් කටයුතු කරනු ඇත.
3. මුහුදේ මසුන් ඇතිකිරීම (Fish Culture) සංවර්ධනය කිරීම.
4. සෑම ධීවරයකුටම අවම මාසික ආදායමක් ලැබෙන වැඩපිළිවෙලක් හඳුන්වා දීම.
5. ධීවර රක්ෂණ ක්‍රමය වඩාත් පුළුල් හා එහි ප්‍රතිලාභ විවිධ ක්ෂේත්‍ර සඳහා හඳුන්වා දීම.
6. ධීවර පවුල් වලට නිවාස ලබාදීමේ ව්‍යාපෘතිය පුළුල් කිරීම.

## අධ්‍යාපනය

### නව අධ්‍යාපන ක්‍රියාවලිය :-

විසිපස් වසරක් පුරා ශ්‍රී ලාංකික දරුවන්ට සිදු වූ බරපතල වරදක් නව අධ්‍යාපන ප්‍රතිසංවිධානයෙන් අප නිවැරදි කර ඇත. නව සහශ්‍රකයට ගැලපෙන විෂය අධ්‍යාපනය, විෂය බාහිර අධ්‍යාපනය හා සහජ කුසලතා වර්ධනය කෙරෙන නව අධ්‍යාපන සැලැස්ම අපේ රජය ඉදිරියට ගෙන යනු ඇත.

1. දැනට ක්‍රියාත්මක කෙරෙන, සෑම ප්‍රාදේශීය කොට්ඨාශයකම උසස්ම මට්ටමේ පාසැල් 02 බැගින් දියුණු කිරීමේ ඕ.එස්.ඕ. ව්‍යාපෘතිය ශක්තිමත්ව ඉදිරියට ගෙන යනු ලැබේ.

2. 2003 වන විට සිංහල, ද්‍රවිඩ, ඉංග්‍රීසි, විද්‍යා, ගණිත, සෞන්දර්ය, ක්‍රීඩා ඇතුළු සියලු ගුරු හිඟයන් අවසන් කිරීම සඳහා පියවර ගැනීම,

3. 2003 වන විට සියලුම ගුරුවරුන් විශේෂ පුහුණු ගුරුවරු බවට පත් කිරීම සඳහා ගුරු පුහුණුව වැඩි දියුණු කිරීම,

4. 2005 වන විට ශ්‍රී ලංකාවේ සියලු පාසැල්වල ගොඩනැගිලි, විද්‍යාගාර, පුස්තකාල, පරිගණක හා ඩෙස් පුටු වැනි සියලු භෞතික පහසුකම් සම්පූර්ණ කිරීම,

5. 2005 වන විට පාසල් නොයන්නන් හා ලාබාල වයසේදී පාසැල් හැර යන්නන්ගේ ප්‍රශ්ණය අවසන් කෙරේ.

6. 2005 වන විට උසස් අධ්‍යාපනයට ඇතුළු නොවන සියලු දරුවන්ට වෘත්තීය අධ්‍යාපනයක් ලබාදීමට කටයුතු කෙරේ.

7. විශ්ව විද්‍යාලවලට ඇතුළත්වීම සඳහා සුදුසුකම් ලබන සියලුම දෙනාට විශ්වවිද්‍යාල අධ්‍යාපන පහසුකම් සලසා දීම. (දේශීය / විදේශීය හා අභ්‍යන්තර හා බාහිර උපාධි පාඨමාලා මගින්)

8. රැකියාවක නිරත වෙමින් විශ්ව විද්‍යාලවල අධ්‍යාපනය ලැබීමට ඇති ඉඩකඩ පුලුල් කෙරෙන අතර, වැඩිහිටි හා සේවක අධ්‍යාපනය තවදුරටත් පුළුල් කිරීම.

9. මෙරට සාම්ප්‍රදායික පිරිවෙන් හා වෙනත් ආගමික අධ්‍යාපන කටයුතු වල භෞතික හා මානව සම්පත් වැඩි දියුණු කිරීම.

10. මෙරට දහම් පාසල් අධ්‍යාපනය අනිවාර්ය කෙරේ.

11. අධ්‍යාපන පර්යේෂණ කටයුතු සඳහා රාජ්‍ය ප්‍රතිපාදන වැඩි කරනු ඇත. උගතුන් හා බුද්ධිමතුන්ගේ සේවය ජාතික සංවර්ධනය සඳහා යොදා ගැනීමේ දැනට අරඹා ඇති වැඩසටහන් පුළුල් ලෙස ක්‍රියාත්මක කෙරේ. (ජනාධිපති කාර්ය සාධක කමිටු හරහා)

12. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළින්, උසස් අධ්‍යාපනය ලබන සෑම දරුවෙකුටම තම අධ්‍යාපනය ඉංග්‍රීසි භාෂාවෙන් කරගෙන යාමට හැකිවන මට්ටමට ඉංග්‍රීසි අධ්‍යාපනය පුළුල් කරන අතර, සෑම සිංහල දරුවෙකුටම ද්‍රවිඩ භාෂාවද, සෑම ද්‍රවිඩ දරුවෙකුටම සිංහල භාෂාවද ඉගැන්වේ.

# සෞඛ්‍ය

**නව සෞඛ්‍ය ක්‍රියාවලිය :-**

ග්‍රාමීය රෝහල් වැඩි දියුණු කිරීම, සෑම දිස්ත්‍රික්කයකම අංග සම්පූර්ණ රෝහල් කිපයක් ඇති කිරීම, සෑම පළාතකම විශේෂඥ වෛද්‍ය සේවා සහිත රෝහල් පද්ධතියක් ගොඩනැගීම සඳහා දැනට අප රජය ආරම්භ කරන ලද වැඩ පිළිවෙල ඉදිරි වසර පහ තුළ සම්පූර්ණ කරනු ඇත.

1. දැනට ඇති වෛද්‍ය හා රෝගී අනුපාතය, හෙදි හා රෝගී අනුපාතය හා උපස්ථායක හා රෝගී අනුපාතය අඩු කිරීමට අවශ්‍ය සෞඛ්‍ය සේවයේ මානව සම්පත් වර්ධනය කිරීම,

2. රෝහල් පරිපාලනය නවීකරණය තුළින් රෝගීන්ට ප්‍රමුඛතාවය දෙන, රජයෙන් ලබාදෙන වරප්‍රසාද නිසියාකාරව රෝගීන්ට ලබාදෙන සෞඛ්‍ය ආයතන ලෙස, රෝහල් ප්‍රතිසංස්කරණය කිරීම.

3. දේශීය වෛද්‍ය ක්‍රමය පුළුල් කිරීම හා පර්යේෂණ වැඩි දියුණු කිරීම.

4. සියලුම පුරවැසියන් සඳහා සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීම.

5. ප්‍රජා සෞඛ්‍ය සේවාව පුළුල් කෙරේ.

# යටිතල පහසුකම්

2005 වන විට කෘෂිකර්මාන්තයට හා කර්මාන්ත සංවර්ධනයට හා පොදු පහසුකම් සඳහා අවශ්‍ය වන ජලය, විදුලිය, මාර්ග හා විදුලි සංදේශ පහසුකම් 75% කින් සපුරාලීමට අපේ රජය කටයුතු කරනු ඇත.

# සමෘද්ධි වැඩ සටහන

දුගී දුප්පත්කම නැති කිරීමේ සමෘද්ධි වැඩ සටහන යටතේ 2005 වන විට අප පහත ඉලක්කවලට ලගාවනු ඇත.

1. පවුලේ ආදායම වැඩිකර ගැනීමට ඉඩකඩක් හෝ හැකියාවක් නොමැති එලදායක නොවන පවුල්වලට මාසිකව රුපියල් 3,000 දක්වා වූ නඩත්තුවට ප්‍රමාණවත් සහනාධාරයක් ලබාදෙනු ඇත.

2. දුප්පතුන්ට නව ආදායම් වාසි සොයාගැනීමට ද, තිබෙන ආදායම් මාර්ග වර්ධනය කරගැනීමට ද අවශ්‍ය වන පුහුණුව, ණය පහසුකම් හා අනිකුත් දිරිගැන්වීම් ලබාදෙනු ඇත. මෙවැනි ව්‍යාපාරවලට අවශ්‍ය සියලු මුදල් ආධාර ඇපකරුවන් හා උකස් ලබා ගැනීම් වලින් තොරව සමෘද්ධි බැංකු වලින් ලබාදෙනු ඇත.
3. දුප්පත් පවුල්වල ළමයින්ගේ මන්දපෝෂණය අවසන් කරනු ඇත.
4. දුප්පත් පවුල්වල සියලුම ළමුන් අනිවාර්යයෙන්ම පාසැල් යවනු ඇත.
5. දුප්පතුන්ගේ සියලු ආපද, හදිසි හා විශේෂ අවස්ථා වඩා ශක්තිමත් ලෙස ආවරණය කෙරෙන සමාජ ආරක්ෂණ ක්‍රමයක් ඇති කිරීම.
6. සමෘද්ධි ලාභීන්ට ශක්තිමත්, පරිපූර්ණ සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයක් ඇති කිරීම.
7. සමෘද්ධිලාභී පවුල්වල දරුවන්ගේ සියලු උසස් අධ්‍යාපන කටයුතු ආවරණය කෙරෙන අධ්‍යාපන රක්ෂණ ක්‍රමයක් ඇති කිරීම.
8. ග්‍රාමීය සංවර්ධනයේ සියලු වගකීම් සමෘද්ධි වැඩ සටහන හරහා තරුණ තරුණියන්ට පැවරීම.

## නිවාස ප්‍රශ්ණය

1. රජයේ හා සංස්ථා සේවකයින්ගේ නිවාස ප්‍රශ්නය විසඳීම සඳහා දැනටමත් 7.2%ක පැවති බැංකු පොලිය 4% ට අඩු කර ඇති අතර, ඉදිරි පස් වසර තුළ රාජ්‍ය හා සංස්ථා සේවයේ සියලු නිළධාරීන්ට දීර්ඝ කාලීන නිවාස ණය පහසුකම් ලබාදෙනු ඇත.
2. නාගරික, ග්‍රාමීය හා වතු ක්ෂේත්‍රවල නිවාස සංකීර්ණ හා නව නගර ඇති කිරීමට ඉදිරි පස් වසර තුළ අප රජය මගින් කඩිනම් වැඩ සටහනක් ක්‍රියාත්මක කෙරේ.
3. 2005 වන විට පැල්පත් හා මුඩුක්කු නිවාස හිමියන්ට ස්ථිර නිවසක් ලබාදීමේ, ජාතික වැඩසටහනක් ආරම්භ කෙරේ.
4. 2005 වන විට මුලු රටේ නිවාස ප්‍රශ්නය 75% කින් අඩු කිරීම.

# මහා පරිමාන ව්‍යාපෘති

ඉදිරි පස් වසර තුල පහත සඳහන් මහා පරිමාණ ව්‍යාපෘති ආරම්භ කර අවසන් කරනු ඇත.

දැනට ආරම්භ කර ඇති කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය තුලින් එය ආසියාවේ ප්‍රධාන වරායක් බවට පත්කරනු ඇත. මෙයට අමතරව,

1. ගාල්ල, හම්බන්තොට හා ඔලුවිල් වරායන් මහා පරිමාන වරායන් ලෙස සංවර්ධනය කෙරේ.
2. කුකුලේ ගඟ ව්‍යාපෘතිය අවසන් කෙරේ.
3. කොළඹ-මාතර අධිවේගී මාර්ගය ලබන වසරේ ආරම්භ කෙරේ.
4. දැනට සියලු මූලික වැඩ සටහන් අවසන් කර ටෙන්ඩර් කැඳවා ඇති කොළඹ, කටුනායක අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් වහාම ආරම්භ කිරීම.
5. කොළඹ-නුවර, අධිවේගී මාර්ගය ලබන වසරේ ආරම්භ කෙරේ.
6. කොළඹ වට රවුම් අධිවේගී මාර්ගය ලබන වසරේ ආරම්භ කෙරේ.
7. කටුනායක ගුවන් තොටුපල ආසියාවේ ප්‍රධාන ගුවන් තොටුපලක් බවට පත් කිරීම දැනට ආරම්භ කර ඇති අතර, 2005 වන විට අවසන් කෙරේ.
8. මව් ආර වාරිමාර්ග ව්‍යාපෘතිය නිම වෙමින් පවතී.
9. කළු ගඟ, නිල්වලා ගඟ, මොරගහකන්ද වාරි ව්‍යාපෘති සැලසුම් නිමකර එවායේ වැඩ කටයුතු ආරම්භ කිරීම.
10. තොරතුරු තාක්ෂණය පුහුණු කිරීමේ මධ්‍යස්ථාන 3ක් කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්ක වල ඇරඹීමේ කටයුතු ආරම්භ කර ඇත. මීට අනුබද්ධිත ප්‍රාදේශීය මධ්‍යස්ථාන 50ක් ක්‍රියාත්මක කර ඇත.

# ආගමික හා සංස්කෘතික කටයුතු

1. අප රටේ අති බහුතරයක්වූ සිංහල බෞද්ධ ජනතාවගේ ආගම වූ බුද්ධාගම හා බුද්ධශාසනය ආරක්ෂා කිරීමටත්, පෝෂණය කිරීමටත් බෞද්ධ පූජනීය ස්ථාන වැඩි දියුණු කිරීමට හා ආරක්ෂා කිරීමටත් ඉදිරි සය අවුරුද්ද තුල වැඩි අවධානයක් යොමු කෙරේ.

2. සෙසු ආගම් හා ආගමික මධ්‍යස්ථාන දියුණු කිරීමට හා ආරක්ෂා කිරීමට ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කෙරේ.

3. පුරා විද්‍යා සංරක්ෂණ හා සංවර්ධන කටයුතු සඳහා නවීන තාක්ෂණය ඇතුල් කෙරේ.

4. සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම දැනට අරඹා ඇති නව සංස්කෘතික මධ්‍යස්ථාන ව්‍යාපෘති සම්පූර්ණ කරනු ඇත. අංග සම්පූර්ණ පළාත් සංස්කෘතික මධ්‍යස්ථාන ඇරඹේ. මේවායේ පුස්තකාල පහසුකම් විවේක හා විනෝද පහසුකම් වැඩි කෙරේ.

5. පුරා වස්තු රැකීමේ රාජ්‍ය ප්‍රතිපාදන පසුගිය වසර හය තුල 4 ගුණයකින් වැඩි කළ අපි, ඉදිරි හය වසර තුළ එය දස ගුණයකින් වැඩි කෙරේ.

6. දැනට පවතින සියළුම නාට්‍යාගාර නවීකරණය කෙරේ.

7. කොළඹ නගරයේ අංග සම්පූර්ණ ජාතික රංග කළා සංකීර්ණයක් ඇති කෙරේ.

8. නව කලා කරුවන් හා නිර්මාණකරුවන්ට රාජ්‍ය අනුග්‍රහය වැඩි කෙරේ.

9. සම්භාවනීය කලාකරුවන් ජාතික වස්තූන් ලෙස සලකා, ආරක්ෂා කිරීමටත්, ඔවුන්ගේ දැනුම හා නිර්මාණශිලීත්වය අනාගත දරුවන්ට බෙදා දීම සඳහා විශේෂ වැඩ සටහනක් ආරම්භ කෙරේ.

10. කලා කරුවන්ට දෙන ආධාර, ආපදා ආධාර, ජීවනාධාර හා විශ්‍රාම වැටුප් ක්‍රම වඩාත් විධිමත් කෙරේ.

11. නව නිර්මාණයන් බිහිකිරීමට කලාකරුවන්ට අවශ්‍යවන පසුබිම හා පහසුකම් සලසා දීම

## රාජ්‍ය සේවය හා වැඩ කරන ජනතාව

1. රාජ්‍ය සේවය ජනතා හා සේවාදායක හිතකාමී, වඩාත් ඵලදායී කාර්යක්ෂම සේවාවක් බවට පත්කිරීමේ ප්‍රතිසංස්කරණ වේගවත් කර ඉදිරියට ගෙන යාම අප රජයේ වැදගත් අරමුණක් වේ.

2. රාජ්‍ය ක්ෂේත්‍රයේ කළමණාකරන, ඉහළ වෘත්තීය මට්ටම්, විද්‍යාත්මක හා තාක්ෂණ සේවයේ විශේෂඥ අවශ්‍යතා සපුරා ගැනීමට පෙළඹීමක් ඇති කරගැනීම සඳහාත්, රාජ්‍ය ක්ෂේත්‍රයේ කුසලතාවන්ට අදාලව සේවා නියුක්ති තත්වයන්හි කළයුතු වෙනස්කම් සොයා බැලීම සඳහාත් ශ්‍රී ලංකාව සහ සමාන වෙනත් රටවල ඇති වැටුප් ව්‍යුහයන් පිළිබඳ සොයාබලා නව වැටුප් ක්‍රමයක් යෝජනා කිරීම සඳහාත්, වැටුප් විෂමතා සහමුලින් නිවැරදි කිරීම සඳහාත්, වඩාත් ඉහළ ඵලදායීතාවක් හා කාර්යක්ෂමතාවයක් රාජ්‍ය සේවය තුළ ඇති කිරීම සඳහාත්, නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අතිගරු ජනාධිපතිනිය විසින් වෘත්තීය සමිති නියෝජිතයන් ඇතුළුව පත් කර ඇති ජනාධිපති කොමිෂන් සභාවේ යෝජනා වහාම ක්‍රියාත්මක කිරීමට අපේ රජය විසින් කටයුතු කරනු ඇත.
3. යල් පැන ගිය ආයතන සංග්‍රහය, මූල්‍ය රෙගුලාසි නවීකරණය කොට රාජ්‍ය අංශය දැවැන්ත ලෙස ප්‍රතිසංවිධානය කිරීම.
4. කාර්යක්ෂම ඇගැයීම්, සේවක අභිප්‍රේරණය මුල් කරගත් උසස්වීම්, මාරුවීම්, පුහුණු වීම් හා වැටුප් ක්‍රමයන් ක්‍රියාවට නැංවීම.
5. කාර්යක්ෂම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු හා ආයතන තෝරා අගැයීමට ලක් කෙරේ.
6. ජීවන තත්වය උසස් මට්ටමක පවත්වා ගැනීමට හැකි, ශ්‍රම කාර්යක්ෂමතාවය අගය කරන වැටුප් ක්‍රමයක් හඳුන්වාදීම.

## ජ්‍යෙෂ්ඨ පුරවැසියෝ

1. ඉදිරි දශකය තුළ ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් වැඩි ප්‍රතිශතයක් වයස අවු : 60 ඉක්මවයි. ඒ නිසා එම ජ්‍යෙෂ්ඨ පුරවැසියන් හා විශ්‍රාමලාභීන් සඳහා විශාල සමාජ ආරක්ෂණ වැඩ පිළිවෙලක් දියත් කිරීමට ඔවුන් සඳහාම වෙන් වූ විශේෂ ආයතනයක් පිහිටුවනු ඇත.
2. ඒ තුළින් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ විශ්‍රාම වැටුප්, ආධාර, දීමනා හා පහසුකම් විටින් විට නොකඩවා පුළුල් කෙරේ.

## බදු

1. සහල්, පිටි, සීනි, අල, ළූනු, මිරිස්, එළවළු, කිරි, බෙහෙත් ද්‍රව්‍ය, ගමනාගමනය, කෘෂිකර්ම උපකරණ, බීජ වර්ග, අධ්‍යාපන උපකරණ, ක්‍රීඩා උපකරණ ඉදිරියටත් සම්පූර්ණයෙන් භාණ්ඩ හා සේවා බද්දෙන් නිදහස්ය.
2. භාණ්ඩ හා සේවා බද්ධ එදිනෙද අත්දැකීම් මත තවදුරටත් මහජන ප්‍රතිලාභ වැඩිවන ලෙස ප්‍රතිසංස්කරණය කෙරේ.
3. රේගුව හා අදයම් දෙපාර්තමේන්තුව පුළුල් ප්‍රතිසංස්කරණයට ලක් කරමින් බදු ක්‍රමය තවත් පහසු හා සරල කරනු ඇත. පුද්ගල හා ව්‍යාපාර බදු සහන පුළුල් කරනු ඇත.
4. රටේ වාණිජ හා කාර්මික කටයුතු සඳහා ලබාදෙන බදු සහන තව දුරටත් වැඩි කිරීම.

## මත් උවදුරු හා සමාජ අපචාර

මත් ද්‍රව්‍ය, මත් කුඩු, සමාජ අපචාර හා අපරාධ වලින් සියලු ලාංකික ජනතාව ගලවාගැනීම සඳහා අප විසින් අරඹා ඇති වැඩ සටහන් පාසැල් හා ගම් මට්ටමින් ශක්තිමත්ව වර්ධනය කර, තරුණයන්, රාජ්‍ය සේවයකයන්, පොලීසිය හා ආගමික නායකයින් තව දුරටත් සම්බන්ධ කර ගෙන මෙම වැඩ සටහන ගෙයින් ගෙට ගෙන යාමේ වැඩ සටහනක් බවට පත් කරනු ඇත.

# කාන්තා හා ළමා අයිතිවාසිකම්

1. පළමු වතාවට අප රජය විසින් ආරම්භ කරන ලද කාන්තා හා ළමා අයිතිවාසිකම් සුරකීමේ වැඩ සටහන් ශක්තිමත් කිරීමට රටපුරා කුඩා ළමයින් සඳහා දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඇති කිරීමට ද තුන්වෙනි ලෝකයේ පළමු වතාවට පිහිටුවන ලද "ළමා ආරක්ෂණ අධිකාරිය" ශක්තිමත්ව හා පුළුල්ව ක්‍රියත්මක කරවීම.

2. ශ්‍රී ලංකාවේ පුරවැසි භාවය හිමි පිරිමි අයෙක් විදේශික කාන්තාවක් විවාහ කරගතහොත් ඇයටත්, ඇයට උපදින දරුවන්ටත් ශ්‍රී ලංකා පුරවැසිභාවය ලැබේ. එහෙත් ශ්‍රී ලාංකික කාන්තාවක් විදේශික පිරිමියෙක් විවාහ කරගෙන ලංකාවේ ජීවත් වුවහෝ ඔහුට හෝ ඔහුට දව උපන් දරුවන්ට ශ්‍රී ලංකා පුරවැසි භාවය නොලැබේ. මෙය පැහැදිලි ලෙස ශ්‍රී ලාංකික කාන්තා හා ළමා අයිතිවාසිකම් උල්ලංඝනයක් බව අපේ හැඟීමයි. මේ නිසා මේ නීතිය සම්පූර්ණයෙන් වෙනස් කර ශ්‍රී ලාංකික පිරිමින්ට ඇති අයිතිය එලෙසම ගැහැණු අයටත් ලබා ගැනීමට ඉඩ සැළැස්වීමට කටයුතු කරමු.

3. 2005 වනවිට ළමුන් රැකියාවල යෙදවීම හා වීදි දරුවන්ගේ ප්‍රශ්න සහමුලින් අවසන් කෙරේ.

# පරිසරය

1. ස්වාභාවික වනාන්තර හා ජල මූලාශ්‍ර විදේශ ආධාර යටතේ ආරක්ෂා කිරීමේ ජාතික වැඩසටහන් තව තවත් වැඩි දියුණු කෙරේ.

2. වනාන්තර ආරක්ෂා කිරීම සඳහා රටේ සිවිල් සමාජය, බුද්ධිමතුන් හා පාසැල් දරුවන් එකරාශි කෙරෙන නව වැඩසටහනක් ආරම්භ කෙරේ.

3. සියලු රක්ෂිත වනයන්ගේ මායිම් නිවැරදිව ලකුණු කිරීම හා වැටවල් බැඳීම වසර 2005 වන විට අවසන් කෙරේ.

4. දර සහ දැව අවශ්‍යතාවයට වෙනම වනාන්තර ඇති කිරීමේ ව්‍යාපෘතිය තව තවත් ශක්තිමත් කෙරේ.
5. වනාන්තර විනාශ නොකර රැකා ගනිමින්, එහෙත් එවා ඒ අවට ජනතාවට වාසි සලසන ආර්ථික ඒකකයක් බවට පත් කිරීමේ ජාතික ව්‍යාපෘතියක් ආරම්භ කිරීම.
6. පරිසරය ආරක්ෂාකිරීම, අලංකාර කිරීම, වායු දූෂණය නැති කිරීම, කැළි කසළ ඉවත් කිරීම 2005 වන විට පළාත් සභා හා පළාත් පාලන ආයතන හරහා 100 % ක්‍රමවත් කෙරේ.
7. කැලි කසළ ප්‍රතිචක්‍රීකරණය කරන වැඩසටහන් ලොකු කුඩා සෑම නගරයකම ආරම්භ කෙරේ.
8. 2005 වන විට පොළිතීන් භාවිතය අවසන් කෙරේ.
9. වනාන්තර, පස, මුහුදු වෙරළ, වාතය සහ ජලය ආරක්ෂා කර ගැනීමේ ජාතික වැඩ සටහනක් ආරම්භ කරන අතර එම වැඩසටහනට අනුබද්ධ පරිසර සුරැකීමේ වැඩසටහන් පාසල් වල අනිවාර්ය කෙරේ.

## මහජන නියෝජිතයා

1. පාර්ලිමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතන වල මැති ඇමතිවරුන්, නගරාධිපතිවරුන් හා සභාපතිවරුන් සභා රැස්වීම්වලට පැමිණීම, ඔවුන්ගේ වගකීම් ඉටු කිරීම, ඔවුන්ගේ අවංකභාවය හා ජනතා සේවයට කැපවීම තහවුරු කිරීම පාර්ලිමේන්තුව ඇතුළු එම සභාවන්හි හැසිරීම පිළිබඳව විශේෂ නීතිරීති හා ස්ථාවර නියෝග සම්පාදනය කරනු ඇත.


# සදාචාර සම්පන්න,

# ප්‍රජාතන්ත්‍රවාදී, සාමකාමී, රටක්,

# තිරසාර සංවර්ධන මාවතක්,

# මිනිස්කම අගයන
# ජනතාවක් සඳහා.....

ජනාධිපති කාර්යාලයේ
පුස්තකාලය
REFERENCE



# පොදුජන එක්සත් පෙරමුණ

[illegible]

# අපේ දර්ශනය

## පොදුජන එක්සත් පෙරමුණ

CM K 0009/Pa/1777